# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2007 අංක 08 දරන ලංකාවේ ඕලන්ද රෙපරමාදු සභාව පොදු නියෝජිත මණ්ඩලය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2007 මාර්තු මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2007 මාර්තු මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

මිළ : රු. 4.25 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි

# 2007 අංක 08 දරන ලංකාවේ ඕලන්ද රෙපරමාදු සභාව පොදු නියෝජිත මණ්ඩලය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2007 මාර්තු මස 21 වන දින]

එල්.ඩී.—ඕ (අයි.එන්.සී.) 14/2005

(329 වන අධිකාරය වූ) ලංකාවේ ඕලන්ද රෙපරමාදු සභා පොදු නියෝජිත මණ්ඩලය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

ලංකාවේ ඕලන්ද රෙපරමාදු සභා පොදු නියෝජිත මණ්ඩලය 1926 අංක 9 දරන ලංකාවේ ඕලන්ද රෙපරමාදු සභා පොදු නියෝජිත මණ්ඩලය ආඥාපනත මගින් සංස්ථාගත කරනු ලැබූ හෙයින් ද :

ලංකාවේ ඕලන්ද රෙපරමාදු සභා පොදු නියෝජිත මණ්ඩලය, එහි නාමය "ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි රෙපරමාදු සභා පොදු නියෝජිත මණ්ඩලය" යනුවෙන් වෙනස් කිරීමට දැන් අදහස් කරන හෙයින් ද :

එකී නාමය වෙනස් කිරීම බලාත්මක කිරීම සඳහා එම ආඥාපනත සංශෝධනය කිරීමට ලංකාවේ ඕලන්ද රෙපරමාදු සභා පොදු නියෝජිත මණ්ඩලය දැන් ඉල්ලුම්කර ඇති හෙයින් සහ එම ඉල්ලීම ප්‍රදානය කිරීම යෝග්‍ය වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය..

1. මේ පනත 2007 අංක 08 දරන ලංකාවේ ඕලන්ද රෙපරමාදු සභා පොදු නියෝජිත මණ්ඩලය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

"ලංකාවේ ඕලන්ද රෙපරමාදු සභා පොදු නියෝජිත මණ්ඩලය" සහ "ඕලන්ද රෙපරමාදු සභාව" යන්න පිළිවෙළින් "ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි රෙපරමාදු සභා පොදු නියෝජිත මණ්ඩලය" සහ "ක්‍රිස්තියානි රෙපරමාදු සභාව" යනුවෙන් හැඳින්විය යුතු බව.

2. (329 වන අධිකාරය වූ) ලංකාවේ ඕලන්ද රෙපරමාදු සභා පොදු නියෝජිත මණ්ඩලය ආඥාපනතේ (දීර්ඝ නාමයේ හැර) හෝ එකී ආඥාපනත යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් රීතියක, දැන්වීමක හෝ වෙනත් ලේඛනයක (එම නාමයෙන් හෝ "ඕලන්ද රෙපරමාදු සභාව" යන කෙටි යෙදුමෙන්) ලංකාවේ ඕලන්ද රෙපරමාදු සභා පොදු නියෝජිත මණ්ඩලය සඳහන් කරනු ලැබ ඇති සෑම අවස්ථාවක, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, "ලංකාවේ ඕලන්ද රෙපරමාදු සභා පොදු නියෝජිත මණ්ඩලය" යන යෙදුම සහ "ඕලන්ද රෙපරමාදු සභාව" යන යෙදුම වෙනුවට, "ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානු රෙපරමාදු සභා පොදු නියෝජිත මණ්ඩලය" සහ "ක්‍රිස්තියානි රෙපරමාදු සභාව" යන යෙදුම් ආදේශ කරනු ලැබිය යුතු ය.

2-PL 001180 - 4,250 (2006/05)

කොන්ත්‍රාත්, ගිවිසුම්, නඩු, අභියාචන, අයිතිවාසිකම් සහ බැඳීම් ආදිය දිගටම පවත්වාගෙන යාම.

3. (1) ලංකාවේ ඕලන්ද රෙපරමාදු සභා පොදු නියෝජිත මණ්ඩලය විසින් හෝ එහි වාසියට මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවීමේ දිනයට පෙරාතුව ම සාදන ලද, නිකුත් කරන ලද හෝ ලියා අත්සන් කරන ලද කවර හෝ සියලුම කොන්ත්‍රාත්, ගිවිසුම්, සහතික හෝ වෙනත් සාධන පත්‍ර හෝ ලේඛන, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේ දී හෝ එදිනට පසුව, ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි රෙපරමාදු සභා පොදු නියෝජිත මණ්ඩලය විසින් හෝ එහි වාසියට සාදන ලද, නිකුත් කරන ලද හෝ ලියා අත්සන් කරන ලද ලෙසට සලකනු ලැබිය යුතු ය.

(2) ලංකාවේ ඕලන්ද රෙපරමාදු සභා පොදු නියෝජිත මණ්ඩලය විසින් හෝ එයට එරෙහිව පවරනු ලැබ, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විභාග වෙමින් පවතින සියලුම සිවිල් නඩු, නඩුකර, අභියාචන සහ වෙනත් නඩු කටයුතු නතරවීම හෝ පවත්වාගෙන යාම නතර කිරීම නොවිය යුතු අතර, ඒවා ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි රෙපරමාදු සභා පොදු නියෝජිත මණ්ඩලය විසින් හෝ එයට එරෙහිව දිගටම පවත්වාගෙන යාම හෝ බලාත්මක කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී (1) වන උපවගන්තියේ සඳහන් අයිතිවාසිකම්, බැරකම් සහ බැඳීම් හැර, ලංකාවේ ඕලන්ද රෙපරමාදු සභා පොදු නියෝජිත මණ්ඩලයේ සියලුම අයිතිවාසිකම්, බැඳීම් සහ වගකීම්, ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි රෙපරමාදු සභා පොදු නියෝජිත මණ්ඩලයේ අයිතිවාසිකම්, බැඳීම් සහ වගකීම් ලෙස සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.